# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන ධීවර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 දෙසැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන
ධීවර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 දෙසැම්බර් මස 03 වන දින]

එල්. ඩී. — ඕ. 64/70

ධීවර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන ධීවර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර ආඥාපනතේ 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 212 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයන් වශයෙන් හෝ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයන් වශයෙන් ක්‍රියා කිරීමට හෝ නමින් හෝ නිලයෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් ; හා ;"

තවද,

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද බලතල සියල්ල ම හෝ ඉන් යමක් නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයකු වශයෙන් හෝ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයකු වශයෙන් ක්‍රියා කිරීමට හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තකු විසින් අධ්‍යක්ෂවරයාගේ පාලනයට යටත් ව ක්‍රියාත්මක කළ හැකි ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) එහි (අ) ඡේදයට ඉක්බිති ව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරුන් එක් කෙනකු හෝ වැඩි ගණනක් ;"; සහ

(ආ) එහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) වාණිජ අධ්‍යක්ෂ, අලෙවි සංවර්ධන කොමසාරිස්, කොළඹ වරායේ නැව්තොට සංවිධායක හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් යන ධුර තත්කාලයෙහි දරන තැනැත්තන් ;".

2—ඒ 02228—10,607 (3/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ කරන ලද සංශෝධන අතීතයටත් බලපෑම හා කරන ලද පත් වීම් වලංගු බවට පත් කිරීම යනාදිය.

**4.** මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරනු ලබන සංශෝධන එකී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව—

(අ) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර නියෝජ්‍ය ධීවර අධ්‍යක්‍ෂවරයා වශයෙන් හෝ නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීමට හෝ නමින් හෝ නිලයෙන් වූ සෑම තැනැත්තකුගේ ම පත් වීම, සෑම අවස්ථාවන් හි දී ම, මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වලංගු ව කරනු ලැබූ ලෙස හා කර තිබූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

තවද,

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියෙන් හෝ ප්‍රඥප්තිය යටතේ ධීවර අධ්‍යක්ෂවරයා වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ සහ වෙන් කර දෙනු ලැබූ බලතල, යුතුකම් හා කාර්යයන් නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ඒ ප්‍රඥප්තිය ප්‍රකාර හෝ ඒ යටතේ හෝ වලංගු ව ක්‍රියාත්මක කරනු ලැබූ, ඉටු කරනු ලැබූ හා කරනු ලැබූ ලෙස හා ක්‍රියාත්මක කරනු ලැබ ඇති, ඉටු කරනු ලැබ ඇති හා කරනු ලැබ ඇති ලෙස සෑම අවස්ථාවන් හි දී ම සලකනු ලැබිය යුතු ය.